# දහවන සියවසේ සෙල්ලිපි මඟින් හෙළිවන ආර්ථික තත්ත්වය

පී.පී.එස්.සී.පුෂ්ප කුමාර*

ලෝකයේ කිසියම් රටක හෝ සංස්කෘතියක ඓතිහාසිකමය තොරතුරු අනාවරණය කර ගැනීමෙහි ලා ප්‍රාමාණික වන ප්‍රධානතම මූලාශ්‍රයක් ලෙස ශිලා ලේඛන නම් කළ හැකි ය. එම තොරතුරු ගවේෂණයෙහි ලා දහවන සියවසේ සෙල්ලිපිවලට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. ඕනෑම සමාජයක් හෝ රටක් පාලනය කරනු ලබන ප්‍රධාන බලවේගය බවට පත්වන්නේ ආර්ථිකය යි. මන්දයත් රටෙහි සංවර්ධන අරමුණු කරා ළඟාවීමට ආර්ථිකය ප්‍රබල සාධකයක් වන බැවිනි. අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට ක්‍රමයෙන් වැඩෙමින් ආ මෙරට ආර්ථික තත්ත්වය අනුරාධපුර යුගයේ අවසන් භාගය වන, දහවන සියවසේ දී ඉතා දියුණු තත්ත්වයට පත් ව තිබේ. මෙම අධ්‍යයනයෙන් දහවන සියවසේ සෙල්ලිපි මඟින් හෙළිවන ආර්ථික තත්ත්වය විමර්ශනයට ලක් කෙරේ. ලක්දිව නොයෙක් ශිලා ලිපි පිළිබඳ විද්වතුන්ගේ අවධානය යොමු වුවත් නිශ්චිත සියවසක් ඔස්සේ කරුණු ගවේෂණය කිරීම සිදුව ඇත්තේ අල්ප වශයෙනි. දිවයිනේ ස්ථාන කිහිපයක ම විසිරී පැතිරී ඇති දහවන  සියවසට අයත් ශිලා ලිපි අතුරින් මිහින්තලා සෙල් පුවරු ලිපි, බදුලු ටැම් ලිපිය, වේවැල්කැටිය ලිපිය සහ පස්වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය ආශ්‍රයෙන් දහවන සියවසේ මෙරට රාජ්‍ය සේවය, කෘෂිකර්මාන්තය, වෙළෙඳාම, සත්ත්ව පාලනය සහ වෙනත් ආර්ථික තත්ත්වයන් කෙසේ ක්‍රියාත්මක වූයේ ද යන්න පිළිබඳ අවධානය යොමු කිරීමට මෙහිදී බලාපොරොත්තු වේ. මෙහි දී මූලාශ්‍රය වශයෙන් ශිලා ලේඛන සංග්‍රහ ද, ශිලා ලේඛන පිළබඳ සාකච්ඡා කෙරෙන වෙනත් කෘති ද යොදා ගැනෙයි. එහිදී නිශ්චිත වශයෙන් නිගමනය කිරීමට සාධක ඇති කරුණු නිශ්චිත නිගමනයන් සහිතව ද, විවාදාපන්න කරුණු නිශ්චිත නිගමනයකට එළඹීමකින් තොරව ද දක්වෙයි. විවිධ මතවාද සහිත කරුණු සංසන්දනාත්මක ව විමසා වඩාත් ම පිළිගත හැකි මතය ඉදිරිපත් කිරීමට මෙහි දී අපේක්ෂා කෙරේ. දිගු ඉතිහාසයකට උරුමකම් කියන ලක්දිව පුරා පැතිර ඇති දහවන සියවසට අයත් ශිලා ලිපි අධ්‍යයනය කරමින් එහි ඓතිහාසික තොරතුරු ගවේෂණයට විද්වතුන්ගේ මනස යොමු කිරීමත්,ඒ ඔස්සේ පැරණි අර්ථ ක්‍රමය පිළිබඳ අවබෝධයක් වත්මන් පරපුරට දායද කිරීම මේ අධ්‍යයනයේ මූලික අරමුණ යි.

ප්‍රමුඛ පද : දහවන සියවස, සෙල්ලිපි, ආර්ථිකය, ඓතිහාසික, අනුරාධපුර

*සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය sahanchathuranga102@gmail.com